# සමාජයේ බුලතට හිමි ස්ථානය පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

පී.ඒ.ජී.කේ.එච්. කුලරත්න

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
kularathne00@gmail.com

ප්‍රමුඛ පදඃ බුලත් සංස්කෘතිය, සම්ප්‍රේෂණය, සංකේත, ආඪ්‍යත්වය

## හැඳින්වීම

බුලත් යනු සිංහල සංස්කෘතිය සමඟ දැඩිව බද්ධ වී පවතින්නා වූ එක් අංගයක් වශයෙන් දැක්විය හැකිය. ලාංකේය ගැමි සමාජය තුළ පුද්ගලයෙකුගේ උපතේ සිට මරණය දක්වා බුලත් ඔවුන්ගේ ජීවිතයට සම්බන්ධ විය. අනෙක් අතින් එම සමාජය බුලත් යනු ආරක්ෂාව, සශ්‍රීකත්වය, ආඪ්‍යත්වය, සුඛෝපභෝගිත්වය යනාදිය සංකේතවත් කරන සංකේතයක් වශයෙන් ද බුලත් භාවිත වේ. සිංහල සංස්කෘතිය තුළ දක්නට ලැබෙන බුලත ආශ්‍රය කරගෙන ගොඩ නැගුණු සංස්කෘතිය ඒ ආකාරයෙන්ම හින්දු සංස්කෘතිය තුළ දක්නට ඇත. සාහිත්‍ය කෘති තුළ ද බුලත හා සම්බන්ධ කතා පුවත් දක්නට ඇත. සාර්ථකත්වයේ සළකුණක් වශයෙන් සළකණු ලබන අෂ්ඨ භෝගවලට ද ඇතුළත්ය. වසර ගණනාවක් පුරාවට බුලත් කොළවලින් මිත්‍රත්වය හා හොඳ හිත පිළිගැනීමේ සංකේතයක් වශයෙන් ද භාවිත කරයි. නමුත් බුලතට නිසි ගෞරවය ලැබුනේ අතීත සමාජය තුළ පමණි. ලාංකීය මිනිසා තාක්ෂණික වේගයෙන් ඉදිරියට යාමත් සමඟ අප සංස්කෘතිය තුළ තිබුණු බොහෝමයක් සංස්කෘතික අංගයන් සමාජයෙන් පහව යමින් පවතී. ඒ අතරට බුලත් හා බැඳුණු සංස්කෘතිය ද ඇතුළත් ය.

## ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික දත්ත රැස් කිරීම මෙන්ම ද්විතියික දත්ත රැස් කිරීමේ ක්‍රමය භාවිත කරමින් මෙයට තොරතුරු ඇතුළත් කරන ලදී. බුලත් හා බැඳුණු තොරතුරු වැඩි වශයෙන් ලබා ගැනීමේ හැකියාව ඇත්තේ පැරණි පුද්ගලයින්ගෙන් ය. ඒ එම සංස්කෘතිය ඔවුන්ගේ ජීවිත හා බැඳී තිබුණු නිසාවෙනි. බුලත් හා සම්බන්ධ කෘති රචනා වී ඇත්තේ ද එම පැරණි පුද්ගලයින්ගෙන් ලබා ගත් තොරතුරු ආශ්‍රය කරගෙනයි. බුලත් හා සම්භන්ධ ගෙතුණු විවිධ කතා පුවත් මෙන්ම ඒ හා බැඳුණු සිරිත්-විරිත් ද සිංහල ගැමි ජීවිත සමඟ එක් වී පැවතුණි. අනෙක් අතට මෙය පැරණි සමාජය නිරූපනය කරනු ලබන එක් පැතිකඩක් වශයෙන් ද දැක්විය හැකිය. බුලත්වලින් කරනු ලබන චාරිත්‍ර මෙන්ම බුලත හා බැඳුණු සංස්කෘතිය අතීතයේ බහුල වශයෙන් පැවතිය ද වර්තමානයේ එය බොහෝ දුරට සමාජයෙන් දුරස් වෙමින් පවතී. නමුත් පැරණි දෑ අගය කරන පිටිසර ගම්මානවල පමණක් එම සංස්කෘතිය දක්නට ලැබේ. නාගරික වශයෙන් ගත් කල එම සංස්කෘතිය නොමැති තරම් ය. නමුත් සුළු වශයෙන් ඇතැම් චාරිත්‍ර කිහිපයකට පමණක් බුලත් යොදා ගනියි. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ අතීත සමාජයේ දක්නට ලැබුණු බුලත් හා බැඳුණු සංස්කෘතිය වර්තමාන

සමාජය තුළට යම්තාක් දුරට හෝ සම්ප්‍රේෂණය කිරීමයි

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

බුලත් හා සම්බන්ධව ගත් කළ වැඩි වශයෙන් ඒ හා බැඳුණු සිරිත්-විරිත් පවතී. එම සිරිත්-විරිත් ආරම්භ කරන්නේ බුලත් වගා කරනු ලබන ස්ථානයෙනි. බුලත් කොටුවෙනි බුලත් වගාවේ දී අනුගමනය කරනු ලබන විවිධ කෙම් ක්‍රම පවතී. බුලත් වගාව සාර්ථක වන්නේ ද නියම ආකාරයට එය සිදු කළ විට දී පමණි. සෑම සුභ කටයුත්තක් සඳහාම පුද්ගලයින්ට ආරාධනා කිරීම සඳහා බුලත් හුරුල්ලක් පිළිගැන්වීම මෙන්ම බුලත් විටක් පිළිගැන්වීම ආගන්තුක සත්කාරයක් වශයෙන් මෙන්ම මිත්‍රත්වය සහ සමීප බව දැනවීම වශයෙන් අතීත ගැමියා සළකකන ලදී. පුද පූජාවල දී බුලත් භාවිතා කිරීම සුලභ දසුනකි. බෞද්ධ ආගමික කටයුතුවල දී මෙන්ම බලිතොවිල් හා විවිධ කෙම් ක්‍රමවල දී බහුල වශයෙන් බුලත් භාවිත කරයි. දරු උපත්වල දී බුලත් භාවිතා වර්තමාන සමාජය තුළ දක්නට නොලැබුන ද පැරණි ගැමි සමාජය් එම චාරිත්‍රය සිදු කෙරිණි. මල්වර සිරිත්වල දී හා මංගල කටයුතුවල දී බුලත් යොදා ගනියි මෙම කටයුතුවල දී බුලත් භාවිත කරන ආකාරය වෙනස්ය. අවමංගල අවස්ථාවල දී බුලත් හෙප්පුවේ තබන්නේ කනපිට හරවාය.

බුලත් සංස්කෘතිය හා බැඳුණු අනෙකුත් අංග වශයෙන් බුලත් හෙප්පුව ගිරය හා හුණු කිල්ලෝටය දැක්විය හැකිය බුලත් දැමීමට භාවිතා කරන භාණ්ඩය බුලත් හෙප්පුව, බුලත් තට්ටුව වශයෙන් හඳුන්වයි. අතීතයේ සෑම නිවසකම බුලත් තට්ටුවක් තිබුණි. වර්තමානයේ ද සෑම නිවසකම බුලත් තට්ටුව දක්නට නොලැබුණත් බොහෝ නිවස්වල දක්නට ඇත. ගැමියා විසින් බුලත් තට්ටුව භාවිතා කරන ලද්දේ බුලත් දැමීමට වුවත් වර්තමාන නිවෙස්වල එය තබා ඇත්තේ අලංකරණය පිණිසයි. බුලත් අඩුවැඩිය හා ඒවාට අදාළ උපකරණ ආඪ්‍යත්වයේ සංකේතයක් වූ නිසා හෙප්පුවක් හෝ පඩික්කමක් නිවසක නොතිබීම විශාල අඩුවක් වශයෙන් සළකන ලදී. තඹ හා පිත්තල වැනි ලෝහ වර්ග බුලත් හෙප්පුව නිර්මාණය සඳහා භාවිතා කරන ලෝහ වර්ග වේ චාරිත්‍ර සඳහා ද බුලත් තට්ටුව භාවිත කරයි.

සිංහල සංස්කෘතිය හා බැඳුණු බුලත අතීත ගැමි සමාජයේ මුල් බැසගෙන තිබූ අංගයක් විය. සෑම සුබ කටයුත්තක් ඉටු කිරීමට ප්‍රථම මෙන්ම ඇතැම් අවස්ථාවල සෞභාග්‍යයේ සංකේතයක් වශයෙන් ද සිරිත්-විරිත්වල දී ද බහුල වශයෙන් භාවිතා කරන ලදී. බුලත් ආශ්‍රිතව ගෙතුණු කරුණු කාරණා අතීත ගැමි සමාජයේ ගැමි සමාජයේ පැවතිය ද වර්තමාන සමාජය තුළ ඒවා දක්නට නොමැත. තාක්ෂණික පෙරළිය හේතුවෙන් සාරධර්ම සමාජයෙන් පිරිහී ගොස් ඇති අතර අතීතයේ සිට පැවත ආ සිරිත්-විරිත් ද අද සමාජය තුළ නොමැත. බුලත ආශ්‍රිත වූ සංස්කෘතිය ද වර්තමානය වන විට සමාජයෙන් වියැකී යන තත්ත්වයට පත් වී ඇත. එය ගැමිකම රකින ගම්මාන කිහිපයක පමණක් ඉතිරි වී ඇත. නමුත් අප යුතුකම වන්නේ ලොව තාක්ෂණය කෙතරම් දියුණු වුව ද අපගේ සංස්කෘතිය ආරක්ෂා කර ගනිමින් තාක්ෂණය සමඟ කටයුතු කිරීමයි. එසේ වූ විට සිංහල ආරක්ෂා කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. නව පරපුරක් වශයෙන් අපගේ යුතුකම වන්නේ ද පරපුරෙන් පරපුරට පැවත ආ දේශීය සංස්කෘතිය ආරක්ෂා කර අනාගත පරපුරට එය ලබා දිය යුතුය

**ආශ්‍රිත ග්‍රන්ථ:**

බුලත්සිංහල ප්‍රැන්සිස් (1996), බුලත හා බැඳුණු සිරිත්-විරිත්; එස්. ගොඩගේ සමාගම